# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 56 දරන
# කැලෑ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 අගෝස්තු මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1979 සැප්තැම්බර් 07 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 65 යි    තැපැල් ගාස්තුව : ශත 25 යි

# 1979 අංක 56 දරන කැලෑ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 අගෝස්තු මස 30 වන දින.]

එල්.ඩී.—ඕ. 78/78.

**කැලෑ ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1979 අංක 56 දරන කැලෑ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) කැලෑ ආඥාපනතේ 7 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:— — 451 වන අධිකාරයේ 7 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"වැඩිදුරටත් තහනම් කරනු ලැබූ ක්‍රියා.

7. (1) (අ) රක්ෂිත කැලෑවක යම් අලුත් එළි කිරීමක් කරන්නා වූ; හෝ

(ආ) රක්ෂිත කැලෑවකට ගිනි තබන්නා වූ, හෝ අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝග කඩ කරමින් රක්ෂිත කැලෑවකට හෝ එහි යම් කොටසකට හානි කරන ආකාරයකින් යම් ගින්නක් අවුලවන්නා වූ හෝ ඇවිළෙමින් තිබෙන්නට හරින්නා වූ; හෝ

රක්ෂිත කැලෑවක—

(ඇ) තත්කාර්ය සඳහා විශේෂයෙන් බලය දෙනු ලැබූ කැලෑ නිලධරයකු විසින් කලින් කල දන්වනු ලබන කාලවල සහ කලින් කල දන්වනු ලබන යම් ආකාරයකින් හැර, යම් ගින්නක් අවුළ වන්නා වූ, තබන්නා වූ හෝ ගෙන යන්නා වූ;

(ඈ) යම් ගස් හෝ දැව කපා හෙළන, කපන, ඉරන, වෙනස් තත්ත්වයකට පත් කරන, එක්රැස් කරන, ඉවත් කරන හෝ ප්‍රවාහනය කරන හෝ කැලෑවක උපදින යම් ද්‍රව්‍ය එක්රැස් කරන, ඉවත් කරන හෝ ප්‍රවාහනය කරන නැතහොත් යම් ගස්, දැව හෝ කැලෑවක උපදින යම් ද්‍රව්‍ය තම සන්තකයෙහි, ආරක්ෂාවෙහි හෝ පාලනයෙහි තබා ගන්නා වූ;

(ඉ) පලංචියක් බඳින හෝ ඉරුම් වළක් කණින;

(ඊ) වගා කිරීම හෝ යම් වෙනත් කාර්යයක් සඳහා යම් ඉඩමක් එළි කරන හෝ සකසන නැතහොත් දැනටමත් එළි කොට ඇති යම් ඉඩමක් වගා කරන;

2—ඒ 42835-1 2,700 (79/09)

(උ) ස්ථිර හෝ තාවකාලික යම් ගොඩනැගිල්ලක් ඉදි කරන හෝ එසේ ඉදි කරන ලද යම් ගොඩනැගිල්ලක පදිංචි වන ;

(ඌ) යම් පාරක් ඉදි කරන හෝ තමා විසින් ඉදි කරන ලද පාරක් පාවිච්චි කරන ; හෝ

(එ) යම් තාප්පයකට, අගලකට, කණ්ඩියකට, වැටකට, බඩවැටියකට, මාවර වැටකට හෝ වෙනත් මායිම් සලකුණකට හානි කරන හෝ එය වෙනස් කරන හෝ ඉවත් කරන

යම් තැනැත්තකු වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට, කැලයකට කළ හානිය සම්බන්ධයෙන් ඔහු වරදකරු කරන අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි වන්දි මුදලට අමතරව, මේ උපවගන්තියේ (අ), (ආ), (ඇ), (ඈ) හෝ (ඊ) ඡේද යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වූ විටෙක අවුරුදු පහක් දක්වා දීර්ඝ විය හැකි කාලයක බන්ධනාගාරගත කිරීමකට ද, මේ උපවගන්තියෙහි වෙන යම් ඡේදයක් යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වූ විටෙක එක් අවුරුද්දක් දක්වා දීර්ඝ විය හැකි කාලයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් එක් දහස දක්වා විය හැකි දඩයකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය. ඒ වන්දිය නියම කරනු ලැබූ විට, සියලු ආකාරයෙන්ම එය දඩයක් ලෙස සැලකිය යුතු අතර, දඩයක ආකාරයෙන් අයකර ගත යුතු ය. වන්දිය රුපියල් එක් දහසකට වැඩි නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් වරදක් කිරීමට අනුබල දෙන හෝ එවැනි වරදක් කිරීමට සලස්වන යම් තැනැත්තකු වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට ඒ උපවගන්තියෙහි නියම කර ඇති දඬුවමට යටත් විය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) එහි (1) වන උපවගන්තියෙහි (ඇ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

" (ඇ) ගස් සහ දැව කැපීම, ඉරීම, වෙනස් තත්ත්වයකට පත් කිරීම, එක්රැස් කිරීම, ඉවත ගෙන යාම හා ප්‍රවාහනය කිරීම සහ කැලෑවක උපදින ද්‍රව්‍ය එක්රැස් කිරීම, ඉවත ගෙන යාම සහ ප්‍රවාහනය කිරීම විධිමත් කිරීම හෝ තහනම් කිරීම ; ";

(ආ) එහි (2) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) මේ පරිච්ඡේදයෙහි සඳහන් යම් වරදක් කිරීමට අනුබල දෙන හෝ එවැනි වරදක් කිරීමට සලස්වන යම් තැනැත්තකු ද වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට, ඒ වරද සම්බන්ධයෙන් නියම කර ඇති දඬුවමට ම යටත් විය යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියේ අතුරු වගන්තිය වෙනුවට පහත දැක්වෙන අලුත් අතුරු වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

"එසේ වුව ද 20 (1) වන වගන්තිය යටතේ සාදන ලද රීති වලට පටහැනිව, යම් කැලෑවකින් යම් ගස් හෝ දුව කපා හෙලන, කපන, ඉරන, වෙනස් තත්ත්වයකට පත් කරන හෝ ඉවත් කරන නැතහොත් යම් කැලෑවකින් කිරිගල් කඩන යම් තැනැත්තකු, අවුරුදු දෙකක් දක්වා දීර්ඝ විය හැකි කාලයක් බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ හැකි වරදකට වරදකරු විය යුතු ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 24 වන වගන්තියේ (1) වන උප වගන්තියෙහි (උට) සහ (උඩ) ඡේද ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(උට) මාර්ගස්ථව තිබිය දී තහනමට ගනු ලැබූ දැව හෝ කැලෑ වික උපදින ද්‍රව්‍ය හෝ ගෙන ආ හැකි ස්ථාන හෝ මුරපලවල් නම් කිරීමට සහ ඒවා ප්‍රවාහනය කිරීම පිණිස බලපත්‍ර නිකුත් කිරීම සඳහා විධිවිධාන සැලැස් වීමට යම් කැලෑ නිලධරයකුට බලය දීම;

(උඩ) එවැනි ස්ථාන සහ මුරපලවල් කළමනාකරණය හා පාලනය කිරීම සඳහා සහ ඒවායෙහි සේවයෙහි නියුක්ත කරනු ලැබූ තැනැත්තන්ගේ පත්වීම් හා කාර්ය විධිමත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම;".

6. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 25 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(3) මේ පරිච්ඡේදයෙහි සඳහන් යම් වරදක් කිරීමට අනුබල දෙන හෝ එවැනි වරදක් කිරීමට සලස්වන යම් තැනැත්තකු ද වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට, ඒ වරද සම්බන්ධයෙන් නියම කර ඇති දඬුවමට ම යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 27 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තිය 27 වන වගන්තියේ (1) වන උප වගන්තිය ලෙස නැවත අංක කිරීමෙන් ; සහ

(2) නැවත අංක කරනු ලැබූ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන් :—

" (2) යම් කරත්තයක, බෝට්ටුවක, හෝ මෝටර් වාහන යක (1) වන උපවගන්තියෙහි සඳහන් කරන ලද දැව මේ ආඥාපනතේ විධිවිධානවලට පටහැනිව ගෙන යනු ලබන බව විශ්වාස කිරීමට යම් කැලෑ නිලධරයකුට, පොලිස් නිල ධරයකුට හෝ ඒ සම්බන්ධයෙන් බලය දෙනු ලැබූ යම් වෙනත් නිලධරයකුට හේතු ඇති අවස්ථාවක, ඔහු විසින්—

(අ) ඒ කරත්තය, බෝට්ටුව හෝ මෝටර් වාහනය නැවැත්වීමට හෝ නවත්වා ගැනීම සැලැස්වීමට අවශ්‍ය විය හැකි යම් නියමයක්, විධානයක් හෝ සංඥාවක් දිය හැකි ය ; නැතහොත් එසේ අවශ්‍ය විය හැකි උපක්‍රම පාවිච්චි කළ හැකි ය. නැතහොත් එසේ අවශ්‍ය විය හැකි වෙනත් ක්‍රියා මාර්ග ගත හැකි ය ;

(ආ) ඒ කරත්තය, බෝට්ටුව හෝ මෝටර් වාහනය පරීක්ෂා කිරීම හා සෝදිසි කිරීම සඳහා රඳවා ගත හැකි ය ; තව ද

(ඇ) ඒ කරත්තයෙහි, බෝට්ටුවෙහි හෝ මෝටර් වාහන යෙහි තිබී සොයාගත් යම් දැව රඳවා ගත හැකි අතර, VII වන පරිච්ඡේදයෙහි විධිවිධාන සලසා ඇති ආකාරයෙන් ඒ දැව සම්බන්ධයෙන් කටයුතු කළ හැකි ය.

(3) යම් කරත්තයක්, බෝට්ටුවක් හෝ මෝටර් වාහන යක් නැවැත්වීම සඳහා (2) වන උපවගන්තිය යටතේ යම් නියමයක්, විධානයක් හෝ සංඥාවක් දෙනු ලැබූ අවස්ථාවක, තත් කාලයෙහි ඒ කරත්තය, බෝට්ටුව හෝ මෝටර් වාහනය භාරව සිටින්නා වූ රියදුරු, බෝට්ටුකරු හෝ වෙනත් තැනැත්තකු විසින් ඒ නියමය, විධානය හෝ සංඥාව අනුව ඒ කරත්තය, බෝට්ටුව හෝ මෝටර් වාහනය වහාම නැවැත්විය යුතු ය. නැතහොත් නැවැත්වීමට සලස්වනු ලැබිය යුතු ය. ඒ නියමය, විධානය හෝ සංඥාව පිළිපැදීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන නැත හොත් පරීක්ෂණයට හා සෝදිසි කිරීමට බාධා කරන යම් රියැදුරකු, බෝට්ටුකරුවකු හෝ වෙනත් තැනැත්තකු වර දක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 30 වන වගන්තියේ (2) වන උප වගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (2) යම් කැලෑ නිලධරයකු විසින් හෝ තත් කාර්ය සඳහා බලය දෙනු ලැබූ වෙනත් තැනැත්තකු විසින් හෝ ඒ දැව එක් රැස් කළ හැකි අතර, තත් කාර්ය වෙනුවෙන් බලය දෙනු ලැබූ කැලෑ නිලධරයකු විසින් නම් කරනු ලැබිය හැකි ස්ථානයකට ගෙන ආ හැකි ය. ".

9. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 40 වන වගන්තියේ අතුරු වගන්තිය ඉවත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් අතුරු වගන්තිය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කිරීම.

" එසේ වුව ද, යම් දැව හෝ කැලෑවක උපදින යම් ද්‍රව්‍ය ඉක්මණින් හා ස්වාභාවික ලෙස දිරාපත් විය හැකි අවස්ථාවක, නඩු විභාගය අවසන් වීමට පෙර යම් වේලාවක එවැනි දැව හෝ කැලෑවක උපදින ද්‍රව්‍ය විකුණා නඩු විභාගය අවසානයේ දී අධිකරණය විසින් අණ කරනු ලැබිය හැකි ආකාරයකින් කටයුතු කිරීම පිණිස විකිණීමෙන් ලත් මුදල අධිකරණයෙහි තැන්පත් කිරීමට අධිකරණය විසින් විධාන කළ හැකි ය. ".

11. 49 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියෙහි 49 අ වන වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 49 අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"කැලෑ නිලධරයන් ආදීන්ට බාධා කිරීම හෝ අවහිර කිරීම සඳහා දණ්ඩනය.

49 අ. මේ ආඥාපනත යටතේ තම බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කර්තව්‍ය ඉටුකිරීමේ දී සහ කාර්ය කිරීමේ දී කැලෑ නිලධරයකුට, පොලිස් නිලධරයකුට හෝ ඒ වෙනුවෙන් ක්‍රියා කිරීමට බලය දෙනු ලැබූ යම් වෙනත් නිලධරයකුට තර්ජනය කරන, බිය ගන්වන, බාධා කරන හෝ යම් ආකාරයකින් අවහිර කරන යම් තැනැත්තකු වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට, අවුරුදු එකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හෝ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය :

එසේ වුව ද දිසා වන නිලධරයකුගේ, ආණ්ඩුවේ දිසාපතිවරයකුගේ හෝ පොලිස් අධිකාරිවරයකුගේ පදවියට නොඅඩු පදවියක් දරන නිලධරයකුගේ කැමැත්ත ඇතිව මිස, මේ වගන්තිය යටතේ නඩුවක් පවරනු නොලැබිය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය සංශෝධනය කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තිය 58 වන වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක කිරීමෙන් ; සහ

(2) නැවත අංක කරනු ලැබූ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වී තිබුණ ද මේ ආඥාපනතේ 24 වන, 27 වන, 37 වන හෝ 48 වන වගන්තිවල කාර්ය සඳහා කැලෑ නිලධර යකුගේ කාර්යයන් ඉටු කිරීම පිණිස 1958 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය දැව සංස්ථාවේ යම් සේවා නියුක්තයකුට අමාත්‍ය වරයා විසින් බලය දෙනු ලැබිය හැකි ය. තව ද ඒ සේවා නියුක්තයා මෙම කාර්ය ඉටු කිරීමෙහි යෙදී සිටින අතර තුර කැලෑ නිලධරයකු ලෙස සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය සංශෝධනය කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තියේ (ඇ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ඇ) මේ ආඥාපනත යටතේ වූ වැරදි බේරුම් කිරීමෙන් ලැබුණු සම්පූර්ණ මුදල හෝ ඉන් කොටසක් සහ ඒ වැරදි සම්බන්ධයෙන් දැනුම් දෙන්නන්ට, දැනුම් දෙන්නන් පිළිබඳ පාරිතෝෂික ආඥාපනත යටතේ දෙනු ලබන තෑගි මුදල් ඒ අරමුදලට ගෙවීම සඳහා ද, නියෝගවල සඳහන් කරනු ලබන කොන්දේසිවලට යටත්ව ඒ අර මුදලින් දැනුම් දෙන්නන්ට සහ කැලෑ නිලධරයන්ට තෑගි මුදල් ගෙවීම සඳහා සහ මේ ආඥාපනත යටතේ තම බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කාර්ය ඉටු කිරීමේ දී සහ කර්තව්‍ය කිරීමේ දී කැලෑ නිලධරයන්ට, පොලිස් නිලධරයන්ට හෝ වෙනත් නිලධරයන්ට සිදු වන ශාරීරික පීඩා සඳහා වන්දි ගෙවීම සඳහා හෝ ඒ පීඩා වෙන් මරණය සිදු වූ විට, ඒ නිලධරයකුගේ උරුමක්කාර යන්ට වන්දි සහ මේ ආඥාපනත යටතේ නඩු විභාගවල දී සාක්ෂි දීමේ කාර්ය සඳහා අධිකරණයට පැමිණීමේ දී සාක්ෂිකරුවන් විසින් නිසි ලෙස දරනු ලැබූ ගමන් වියදම් ගෙවීම සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය සංශෝධනය කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) "කැලෑ නිලධරයා" යන අර්ථකථනය වෙනුවට පහත දැක් වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

"කැලෑ නිලධරයා" යන්නෙන් වන සංරක්ෂකවරයන්, නියෝජ්‍ය වන සංරක්ෂකවරයන්, ජ්‍යෙෂ්ඨ සහකාර වන සංරක්ෂකවරයන්, සහකාර වන සංරක්ෂක වරයන්, දිසා වන නිලධරයන්, වන පාලකයන්, අඩවි වන නිලධරයන්, වන සංරක්ෂණ ඕවර්සියර් වරුන්, වන ගබඩාකරුවන්, වැඩබිම් ඕවර්සියර්

වරුන්, වන රක්ෂකයන්, කැලෑ මුරකරුවන් හෝ වන කම්කරුවන් නැතහොත් මේ ආඥාපනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් යටතේ කැලෑ නිලධරයකුගේ යම් කර්තව්‍යයක් කිරීම සඳහා නමින් හෝ ධුරයෙන් පත් කරනු ලැබූ සියලු තැනැත්තන් අදහස් වේ ; ".

(ආ) " කැලෑවක උපදින ද්‍රව්‍ය " යන අර්ථකථනයෙහි (ඈ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

" (ඈ) හුණුගල්, හිරිගල්, කබුක්, බිටුමන්, බිටුමන් ශල්ක, ස්වාභාවික තාර, ඛනිජ තෙල් සහ පතල් වල සහ ගල්වලවල්වල සියලු නිෂ්පාදන ඇතුළු පාෂාණභූත කාබනික ද්‍රව්‍ය, මතුපිට පස, ගල් සහ ඛනිජ ද්‍රව්‍ය ; ".

(ඇ) " දැව ගබඩාව " යන අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

' " දැව ගබඩාව " හෝ " දැව අංගණය " යන්නෙන්—

(අ) විකිණීමේ කාර්යය සඳහා ; හෝ

(ආ) ප්‍රවාහණය කිරීමේ කාර්යය සඳහා ; හෝ

(ඇ) යන්ත්‍රානුසාරයෙන් හෝ අන්‍යාකාරයකින් ඉරීමේ කාර්යය සඳහා ; හෝ

(ඈ) යම් නිෂ්පාදන කාර්යාවලියකට භාජනය කිරීමේ කාර්ය සඳහා

දැව ගබඩා කර ඇති ස්ථානයක් අදහස් වේ.'.